# බන්ධනාගාර දෙපාර්තමේන්තුව

## ජාතික ශ්‍රම බලකායට පරිවර්තනීය වෙනසක්

**සිරගත වූවන් ගේ සිරගත නොවූ ශ්‍රමය රටේ නිෂ්පාදන ක්‍රියාවලියට එක් කර ගැනීමට පෞද්ගලික අංශය වෙත ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ඇරයුම් කරයි.**

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාරගතව සිටින රැඳවියන් පුහුණු ශ්‍රමිකයන් ලෙස පුහුණු කර සේවයේ යොදවා ගැනීමටත්, බන්ධනාගාර ආයතන පරිශ්‍ර තුළ කර්මාන්ත ආරම්භ කිරීමටත් රැඳවි පුනරුත්ථාපන ක්‍රියාවලිය සම්බන්ධව උනන්දුවක් දක්වන පෞද්ගලික, අර්ධ රාජ්‍ය හා රාජ්‍ය අංශයේ ආයතනවලට අවස්ථාවක් ලබා දීමට තීරණය කර ඇත.

රැඳවි සුභසාධනය වෙනුවෙන් වූ මෙම වැඩ සටහනට සක්‍රිය දායකත්වයක් දක්වමින් උතුම් සමාජ මෙහෙවරක් කිරීමට උනන්දුවක් දක්වන රාජ්‍ය ,අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලින් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කරනු ලැබේ

**අපගේ අරමුණු**

1. රැඳවියා කුසලතා පූර්ණ වෘත්තිකයකු හා යහපත් පුරවැසියකු ලෙස සමාජ ගත කිරීම
2. රැඳවියාගේ පවුලට ආර්ථිකමය ශක්තියක් සැපයීම
3. සාධාරණ අයකිරීමක් යටතේ සැඟවුනු ශ්‍රම බලකාය නැවත රටේ නිෂ්පාදන ක්‍රියාවලියට එක් කිරීම

**යෝජිත ව්‍යාපෘති ක්ෂේත්‍රයන්**

1. නිශ්පාදන කර්මාන්ත
2. සේවා සැපයීම්
3. කෘෂි කර්මාන්තය
4. ඉදි කිරීම් ක්ෂේත්‍රය

**යෝජනාවලියේ අන්තර්ගත විය යුතු කරුණු**

1. ව්‍යාපෘති ඉදිරිපත් කරන ආයතනයේ නෛතිකභාවය
2. ව්‍යාපෘතියේ විස්තරය ; ව්‍යාපෘතියේ විෂයය පථය, අරමුණු, කාලසීමාව
3. ක්‍රියාත්මක කිරිමේ සැලැස්ම
4. පුනරුත්ථාපන ක්‍රියාවලියට වන දායකත්වය ( පුහුණු සහතික ලබාදීම, NVQ සහතික ලබා ගැනීමට වන දායකත්වය, රැඳවි සුභසාධන කටයුතු පිළිබඳ අවධානය )
5. දෙපාර්තමේන්තු නීතිරීති වලට අනුගතව කටයුතු කිරීමේ එකඟතාවය
6. නිදහස් වූ පසු රැඳවියාට රැකියා අවස්ථාවක් තිබේද යන වග

**<u>සැලකිය යුතුයි</u>**

බන්ධනාගාර ආයතන තුළ හෝ පිටත යන කුමන ආකාරයෙන් යෝජනාව ඉදිරිපත් වුවත් පුනරුත්ථාපනය පදනම් කර ගෙන සිදු කරන කටයුත්තක් බැවින් රැඳවියන් ගේ මානසික සෞඛ්‍යය වැඩි දියුණු කරන ලබන වැඩසටහන් සිදු කල යුතු බැවින් ඒ පිළිබඳව සඳහන් කළ යුතුය.

**ගෙවීම් කටයුතු සිදුකළ යුතු ආකාරය**

බන්ධනාගාර චක්‍රලේඛ හා නීති ප්‍රතිපාදන අනුව;

1. බන්ධනාගාර ඇතුළත පුද්ගලික අංශය විසින් සිදු කරන කර්මාන්තවලදී රැඳවියා වෙනුවෙන් සිදු කළයුතු ගෙවිම

| | |
|---|---|
| එක් රැඳවියකුට දෛනික වැටුප = | රු.640.00 |
| රජයේ ආදායමට අයවිය යුතු මුදල ( රු. 640*75%) | රු. 480.00 |
| සිරකරු සුභසාධක අරමුදලට අයවිය යුතු මුදල 640*10% | රු. 64.00 |
| එක් රැඳවියකුට දිනකට අයවිය යුතු මුදල | රු.1184.00 |

මෙයට අමතරව බන්ධනාගාර පරිශ්‍රයන් හි ආරම්භ කරන ව්‍යාපෘති වෙනුවෙන් සාධාරණ මාසිකව කුලියක් ගෙවිය යුතු වන අතර අදාළ ගොඩනැගිල්ල වෙනුවෙන් වන ජල හා විදුලි බිල්පත් ගෙවීම් සිදු කිරීමටත්, අදාළ කාල පරිච්ඡේදයේ එම ගොඩනැගිල්ලේ සියළු සුළු නඩත්තු කටයුතු සිදු කර ගැනීමත් කල යුතුය.

2. බන්ධනාගාර ආයතනයෙන් පිටත ස්ථාන වල පුද්ගලික අංශය විසින් සිදු කරන කර්මාන්ත වලදී රැඳවියා වෙනුවෙන් සිදු කළයුතු ගෙවිම

| | |
|---|---|
| එක් රැඳවියකුට දෛනික වැටුප = | රු.640.00 |
| රජයේ ආදායමට අයවිය යුතු මුදල ( රු. 640*50%) | රු. 320.00 |
| සිරකරු සුභසාධක අරමුදලට අයවිය යුතු මුදල 640*10% | රු. 64.00 |
| එක් රැඳවියකුට දිනකට අයවිය යුතු මුදල | රු.1024.00 |

මීට අමතරව බන්ධනාගාර ආයතනයෙන් පිටතට රැගෙන යන අවස්ථා වලදී ආහාර , වෛද්‍යාධාර , ප්‍රවාහක පහසුකම් හා ආරක්ෂණ නිලධාරීන් වෙනුවෙන් දෛනික දීමනාවන් ගෙවීමටත් , වැඩකරන කාලය තුළ රක්ෂණාවරණයක් ලබාදීමටත් කටයුතු කළ යුතුවේ.

**ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය**

ඔබගේ යෝජනා **බන්ධනාගාර කොමසාරිස් ජනරාල් , නො 150 , බේස්ලයින් පාර , කොළඹ 09** වෙත ලැබෙන සේ ලියාසදීංචි තැපැලෙන් හෝ ගෙනවිත් භාරදිය යුතුය.

**ව්‍යාපෘතිය තෝරා ගැනීමේ ක්‍රමවේදය**

සම්පූර්ණ තොරතුරු සහිතව සකස් කර ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාවලි බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විශේෂ ඇගයීම් කමිටුවක් මගින් කෙටි ලැයිස්තු ගත කර ඒ අනුව නිර්දේශිත ආයතන වැඩිදුර ඉදිරිපත් කිරීම හා සාකච්ඡා සඳහා කැඳවනු ලැබේ.මෙහිදි රැඳවියාගේ ගරුත්වය , සුරක්ෂිතභාවය හා රැකවරණය යන කරුණු සහතික කර ගැනීම කෙරෙහි වැඩි අවධානය යොමු කරනු ලැබේ . එසේම ආයතනයේ සක්‍යතාව පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ ඉදිරිපත් කරන ලද . ව්‍යාපෘති කමිටුව විසින් පනවනු ලබන කොන්දේසි වලට යටත් විය යුතු අතර ව්‍යාපෘති සම්බන්ධ අනුමැතිය ලබාදීමේ අවසාන තීරණය අදාළ කමිටුව විසින් දරනු ලැබේ .

**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

තෝරාගත් යෝජනා සඳහා අදාළ ආයතන සමග වසර 2 කට නොඅඩු කාලයකට අවබෝධතා ගිවිසුම් ගතව කාර්යය ආරම්භ කරනු ලැබේ.අදාළ ව්‍යාපෘතියේ සාර්ථකත්වය අනුව කාලය දීර්ඝ කිරීමට කටයුතු කරන්නේද, නැද්ද යන්න කමිටුව විසින් තීරණය කරනු ලබයි.

අමතර විමසීම් සඳහා දුරකථන අංක 0114677106 හෝ rehabilitation.php@gmail.com ඔස්සේ සහකාර බන්ධනාගාර අධිකාරි ජයන්ත අදාසූරිය මහතා සම්බන්ධ කර ගන්න.

එච්.එම්.ටී.එන්.උපුල්දෙණිය

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

2024.05.08